# ඒෂියන් ග්‍රැමර් පාසල
## පළමු වාර පරීක්ෂණය - 2019
## 11 - ශ්‍රේණිය
## නර්තනය

කාලය පැය 03

නම:---------------------------- පන්තිය: -----------------------

සැකසුම : නයෝමි දිලූක්ෂිකා

---

### I කොටස

අංක 01 සිට 10 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න

01. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්හි පද කිහිපයක් නටා අවසාන කරනු ලබන දීර්ඝ පද කොටස් --------------------------- වශයෙන් හඳුනුවනු ලැබේ.

I. කණ්ඩිලම, ඉරට්ටිය, දොඹින පද II. කණ්ඩිලම, තාල පද, මාත්‍රා පද

III. කස්තිරම, ඉරට්ටිය, කලාසම IV. කස්තිරම, සීරුමාරුව, අඩව්ව

02. ගීත අනුව නර්තනය නිර්මාණය කිරීමේදී -------------------------

වශයෙන් චලන වර්ග තුනක් කෙරෙහි අවධානය යොමු කල හැකිය.

I. රිද්මයානු කුල චලන, තාලානුකුල චලන, ප්‍රකාශනාත්මක චලන

II. අංග චලන, නිදහස් චලන, ප්‍රකාශනාත්මක චලන

III. අභි චලන, අංග චලන, ඍජු චලන

IV. තාලානුකුල චලන, දඟකාර චලන, රිද්මයානුකුල චලන

03. කැලණි විශ්ව විද්‍යාලිය සෞන්දර්‍ය අධ්‍යන ආයතනය ----------------------- වර්ෂයේදී ස්වාධින විශ්ව විද්‍යාලයක් බවට පත් විය.

I. 2005 II. 2003

III. 2002 IV. 2004

04. ශ්‍රී ලංකාවේ පවතින නර්තන සම්ප්‍රධායන් අතුරෙන් --------------- විවිධ රංග වස්ත්‍රාභරණ දක්නට ලැබේ.

I. භරත නාට්‍ය සම්ප්‍රදායේ II. පහතරට සම්ප්‍රදායේ

III. උඩරට සම්ප්‍රදායේ IV. සබරගමු සම්ප්‍රදායේ

05. මෙහි දක්වා ඇති අනුපිළිවෙලට අනුව තම්මැට්ටම, උඩැක්කිය, සහ දවුල ---------------- වර්ග වලට අයත් වේ.

I. විතතාතත, ආතත, විතත II. ආතත, විතත, විතතාතත

III. ආතත, විතතාතත,විතත IV. විතත, ආතත, විතතාතත

06. පොළොන්නරු යුගයට අයත් ----------------- නර්තන ඉතිහාසය පිළිබඳව රැකම් සොයා ගත හැකි ස්ථාන දෙකකි.

I.කොටවෙහෙරෙ හා වටදාගෙය

II. සරස්වතී මණ්ඩපය හා නිශ්ශංක ලතා මණ්ඩපය

III. අටදාගෙය හා ශිවදේවාලය

IV. සැටදා ගෙය හා කොටවෙහෙරෙ

07. කස්තිරම, ඉරට්ටිය, කලාසම පිළිවෙලන් අයත් වන්නේ ----------------- සම්ප්‍රදායටය.

I. උඩරට, පහතරට, සබරගමු

II. සබරගමු, පහතරට, උඩරට

III. පහතරට, උඩරට, සබරගමු

IV. සබරගමු, උඩරට, පහතරට

08. බැලේ නර්තනය ප්‍රභවය වූ රට වන්නේ,

I. ඉතාලිය

II. ප්‍රංශය

III. රුසියාව

IV. එංගලන්තය

09. මාත්‍රා **2+2+2+4** තිත තාලම්පටින් වාදනය කිරීමේදි --------------------- යනුවෙන් දක්වේ

I. තිත්, තිත්, තෙයි, තෙයි

II. තිත්, තෙයි, තිත්, තෙයි

III. තිත්, තිත්, තිත්, තෙයි

IV. තිත්, තෙයි, තෙයි, තෙයි

10. ගැටබෙරයේ සම්මිත දිග ප්‍රමාණය ---------------------- වේ.

I. දෙවියත් තුන් ගුලකි.

II. තුන්වියත් තුන් ගුලකි

III. සිව් වියත් තුන් ගුලකි

IV. තුන් වියත් එක් ගුලකි

අංක 11 සි 19 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

11. ගම්පොල යුගයේදි නැටුම් පිළිබඳ මූලාශ්‍ර ලෙස ගල් කැටයම් හා ලී කැටයම් දක්නට ලැබේ.

I. අලුත් නුවර හා ඇම්බැක්කේ දේවාලය

II. ගඩලාදෙණිය හා මහනුවර පත්තිනි දේවාලය

III. ගඩලාදෙණිය හා දෙගල්දොරුව දේවාලය

IV. ගඩලාදෙණිය හා ඇම්බැක්කේ දේවාලය

12. උඩරට වෙස් ඇඳුම් කට්ටලය අයත් වන්නේ

I.පායින්පත, සිබාබන්ධනය, නෙත්තිමාලය, අවුල්හැරය

II. පායින්පත, සිබාබන්ධනය, ඉන හැඩය, නළල් පටිය

III. පායින්පත, සිබාබන්ධනය, නෙත්තිමාලය, කඩුක්කන්

IV. පායින්පත, උරමාලය, නෙත්තිමාලය

13. 5,6,7 යන සරඹ මේ නමින් හැඳින් වේ.

I.ඇල සරඹය, දූල සරඹය, අර්ධ චක්‍ර සරඹය

II. දූල සරඹය, අංගහාර සරඹය, චන්ද්‍රිකා සරඹය

III. ඇල සරඹය, පැනීමේ සරඹය, චන්ද්‍රිකා සරඹය

IV. ඇල සරඹය, දූල සරඹය, චන්ද්‍රිකා සරඹය

14. ආධුනික නැට්ටුවන් අතරින් ඉතා සීඝ්‍රයෙන ඇත් වන උපකරණයකි ,

I.තම්මැට්ටමට අවශ්‍ය කඩිප්පුව

II. පවන් සැලීමට අවශ්‍ය චාමර

III. ගැමි නැටුමට අවශ්‍ය චාමර

IV. මණ්ඩිය සකස් කර ගැනීමට අවශ්‍ය දණ්ඩි කද

15. "උදයට හිරු දෙව් වැදපල්ලා"මෙහි ලඝු අක්ෂර ගනන වන්නේ

I. දොළහකි

II. දහසයකි

III. දහ හතරකි

IV. දහ අටකි

16. කරත්ත කවි, පැල් කවි පාරු කවි අයත් වන්නේ,,

I. ආසාතාත්මක ගී වශයෙනි

II. ආනාසාතාත්මක ගී වශයෙනි

III. විෂමසාත්මක ගී වහයෙනි

IV. ජයග්‍රාහක ගී වශයෙනි

17. "ඉපිද ඒ බෝසත් නා ලොව වරෙක - පැහැද රකිති සිල් නරලොව වනයක" මෙම කවි පදය ගායනයේ දී වාදනය සඳහා සුදුසු බෙර පදය

I. දොං දොං ජිං ජිං ගජිගත

II. දොං ජිං ජිං තකට දොං තක

III. ජිං ගත ගො ගො

IV. දොං තකු දොං ජිං ගත්තක් ජිං තක

18. නර්තන කාලාවට අධිපති දෙවියා වන්නේ

I. ශිව දෙවියන්

II. ගනපති දෙවියන්

III. සරස්වකඳති දෙවියන්

IV පත්තිනි දෙවියන්

19. කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන නර්තන අංග වේ.

I. යක් ඇඳුම, ගිරිදේවි , වාහල

II. ආවැන්දුම, තෙල්මෙ, මුදුන්තාලිය

III. යක් ඇනුම, ආවැන්දුම, කුවේණි, අස්න

IV. කුවේණි, අස්න, ගිරිදේවි, මුදුන් තාලය

ප්‍රශ්න අංක 20 සිට 24 දක්වා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| රබාන | ගැට බෙරය | තාලම්පට | ඕඩිය |
| තම්මැට්ටම | බුම්මැඩිය | දැකැත්ත | දඬු බෙරය |
| දවුල | උඩැක්කිය | පන්තේරුව | ගෙජ්ජි |
| සොර්ෂක බෙරය | කස්තිරම | හොරණෑව | අවුල් හැරය |

20. ආතත වාදය භාණ්ඩය අයත් වන්නේ

I. A සහ C වය.
II. B සහ C වය.
III. C සහ D වය.
IV. A සහ D වය.

21. විතත වාද්‍ය භාණ්ඩය අයත් වන්නේ

I. A සහ B වය.
II. B සහ C වය.
III. C සහ D වය.
IV. A සහ D වය.

22. කමත් ආශ්‍රිත නර්තන වලදී භාවිතා කරන වාදය භාණ්ඩය සහ රංග උපකරණයදැකිය හැකි වන්නේ

I. A සහ B වය.
II. B සහ C වය.
III. C සහ D වය.
IV. A සහ D වය.

23. හේවිසි වාදනයේදී ප්‍රධාන වශයෙන් යොදා ගන්නා වාද්‍ය භාණ්ඩය දැකිය හැක්කේ

I. A සහ C වය.
II. B සහ D වය.
III. A සහ D වය.
IV. B සහ C වය.

24. ඝන වාද්‍ය භාණ්ඩය අයත් වන්නේ

I. A සහ B වය.
II. B සහ Cවය.
III. C සහ D වය.
IV. A සහ D වය.

25. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් විශේෂිත වූ වචන ඇත්තේ

I. A සහ C වය.
II. B සහ Dවය.
III. A සහ D වය.
IV. B සහ C වය.

සියළු ප්‍රශ්න වලට සුදුසු පිළිතුර තෝරන්න

26. දෙතිතේ ප්‍රබේද වන්නේ

I. එකකි
II. තුනකි
III. දෙකකි
IV. හතරකි

27. ගම්පොළ යුගයේ ලංකාවට පැමිණි විදේශීය වාර්ථාකරු වන්නේ

I. ස්පිල් බර්ජන්
II. ඉබන් බතුතා
III. රොබට් නොකස්
IV. පාහියන්

28. "තාම් දොමිති --------- කඩතක තරිකිට ----- දොමිති ගත කිත්තක් කුචකුද තාකු ------- තරිකිට කුංදත් තා" මෙහි හිස්තැන්වලට අයත් පද කොටස් වන්නේ

I. කුංදත් තරිකිට, රුදග, කුංදත් කඩතක
II. ගත දොම්කිට පීකුතක, කුද කුද
III. ගතකුද, පීකුදක්, පීත්ත ගත
IV. ගත දොම්කිට

29. "දුරක් බැලුම නොව ලගත් බලන අය-----"මෙහි ඉතිරි පද කොටස වනුයේ

I. ළිඳක් තුළක ඉබි ලඩෙක් කරපු වැඩ.
II. හටත් මෙලෙසෙ වෙයි කැටත් තබම් දඩ
III. ඇරත් මෙහෙමෙ යස වැඩක් උනේ නැත.
IV. වටත් අයට දැනෙනටත් කියිම් මම.

30. මාත්‍රා හතරේ තාලය යනුවෙන් හඳුන්වනු ලබන්නේ

I. මැදුම් තනි තිතටය
II. මහ තනි තිතය
III. සුළු තනි තිතය
IV. සුළු මැදුම් දෙතිතය

31. පා සරඹ හා දොම්න පද පුහුණුව ලැබීමෙන් ශාරීරයේ මූලිකාංග මනාව සකස් වන්නේ

I. දක්ෂ ශිල්පියෙකුගේය
II. ආධුනිකයෙකුගේය
III. පළපුරුදු ශිල්පියෙකුගේය
IV. කල එළි බසින ශිල්පියෙකුගේය

32. තාලම්පටෙහි පියන්පත් දෙක එකිනෙක මුහුණත් වැසියන සේ වාදනය කිරීමෙන් උපදින ධ්වනිය වන්නේ

I. "තෙයි" යනුවෙනි
II. . "තිත්" යනුවෙනි
III. "තා" යනුවෙනි
IV. "තිත" යනුවෙනි

33. දුල්පා පොඩිතුරු ජයගොස නාදෙට මෙම කවියේ මීලඟ පාදය වනුයේ

I. රන්දෝලිය ලෙස යන දෝලා පිට
II. සොල්වා දමමින් චාමර අහසට
III. ගනිමින් චාමර සැලුවේ මුනිඳුට
IV. බසිමින් චාමර ගත්තේ සුරතට

34. "ත්‍රිවිධ ඥාන විදුරු පඩි අපේ මහ" මෙය

I. රබන් කවියකි
II. කුළු කවියකි
III. ගොයම් කවියකි
IV. කළගෙඩි කවියකි

35. කොහොමා කංකාරි යේදී නර්තන ශිල්පින් හඳුන්වන නාමය වන්නේ

I. අතෝකරුවන්
II. කපු මහතුන්
III. යක්දෙස්සන්
IV. පත්තිනි හාමි

36. නර්තනය පිළිබඳ ඓතිහාසික තොරතුරු විමසීමේදී යොදා ගත හැකි මූලාශ්‍ර ලෙස හැඳින්වන්නේ

I. පුරාවිද්‍යාත්මක සාධක හා ජනකතා
II. වංශ කතා හා දේශාටකයන්ගේ වාර්ථා
III. සෙල්ලිපි හා ඇදහිලි විශ්වාස
IV. පුරා වෘත්ත හා චිත්‍රමූර්ති

37. දේශීය ගැමි නැටුම් බිහි වීමට මූලාශ්‍ර වී ඇත්තේ

I. ඔවුන්ගේ ආගම ජන ගී හා ඒකාකාරී බව
II. මවුන්ගේ විශ්වාස ජීවන වෘත්තින් හා විනෝදාස්වාද
III. මවුන්ගේ විශ්වාස ඇදහිලි හා වෘත්තිය
IV. ඔවුන්ගේ ඇදහිලි, වෘත්තින් හා ආර්ථික රටාව

38. චතුර්විධ අභිනය ප්‍රධාන කොටස් කීයකට බෙදා වෙන් කර ඇත්ද?

I. 08 කි. II. 04 කි.

III. 09කි IV. 02කි.

39. නොගැළපෙන පදය තෝරන්න.

I. ආවැන්දුම II. අස්නෙ

III. ආලාර්ති පදය IV. අයිලය

40. අස්නෙ හා ආවැන්දුම යන නර්තන අංග ඇතුළත් වන්නේ

I. වලියක් මංගල්ලයේ II. හැටපස් මංගල්ලයේ

III. කඩවර කංකාරියේ IV. මහසෙහෙතේ සමය වේ.

(ලකුණු 40)

## II කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 ට පිළතුරු සපයන්න

01. සියළුම ප්‍රශ්න වලට සුදුසු පිළිතුර අදාල තිත් ඉරමත ලියන්න

I. ලී කැටයමින් කල නලගනකගේ රූපයක් -------------------- දක්නට ඇත.
II. ගුරුහාමි හා වෙදරාළ ---------------------- නාටකයට අයත් චරිත දෙකකි. දීය
III. ශ්‍රී වීර පරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේදි ගායනය සඳහාම තිබූ සුවිශේෂි ආයතනය වන්නේ ------------------- වේ.
IV. "කතකලි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ------------------- නම් වේ.
V. මුරුගන් දේවියන් සඳහා කරනු ලබන නර්තනය --------------------- නම් වේ.
VI. විජය රජු හා කුවේණිය සම්බන්ද පුරාවෘත්තය -------------------- හා බැදේ.
VII. ග්‍රහ පන්ති කවි ගායනා කරන්නේ --------------------- ශාන්තිකර්මයේදිය.
VIII. ලෝක නර්තන දිනය යෙදී ඇත්තේ --------------------- දිනටය.
IX. අවකාශ භාවිතයේදි තල --------------------- ක් හා --------------------- 10ක් භාවිතා කළ හැකිය
X. රූපවාහිනියේ දක්නට ලැබෙන නර්තන වැඩසටහන් 02 ක් නම් කරන්න.

I. -------------------- II. -------------------- (ලකුණු 12)

02. I. තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත්තත් ජිං තරිකිට මෙම බෙර පදය මාත්‍රා 2+2+3 තුන් තිතිට ප්‍රස්ථාර කරන්න.
II. මාත්‍රා 2+4 අයත් කවියක් ප්‍රස්ථාර කරන්න..
III. මුසලඩි වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 12)

03. දේශිය ශාන්ති කර්ම ඇදහිලි හා විශ්වාසමත පදනම් වී ඇත.

I. උඩරට ශාන්තිකර්ම පැවැත්වීමේ පොදු අරමුණු 04 ක් ලියන්න.
II. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක චාරිත්‍ර 02 ක් විස්තර කරන්න.
III. ශාන්ති කර්ම වල එන කතා පුවත් තුලින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න. (ලකුණු 12)

04. I. දේශිය වාද්‍ය භාණ්ඩ සන්නිවේදන කාර්ය සඳහා යොදා ගෙන ඇති අවස්තා 02 ක් නම් කරන්න්
II. එක් වාදන අවස්ථාවක් ගෙන ඒ සඳහා යොදා ගෙන ඇති විධි ක්‍රම පිලිබඳව කෙටියෙන් හඳුන්වන්න
III. කැමති වාද්‍ය භාණ්ඩ දෙකක සමාන අසමානතා 03 බැගින් දක්වන්න. (ලකුණු 12)

05. I. නර්තන කලා ඉතිහාසය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර 04 ක් නම් කරන්න.

II. අනුරාධපුර යුගයේදි නර්තන කලාව බුදු දහම ඇසුරෙන් පෝෂණය වී ඇති බවට සනාථ කළ හැකි සාධක දෙකක් කෙටියෙන් ලියන්න.

III. ගම්පොල යුගයේදි නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබී ඇති අයුරු දේශාටන වාර්තාවක් ඇසුරෙන් දක්වන්න්. (ලකුණු 12)

07. I. සොකරි ගැමි නාටකය පැරණි ගැමි නාටකයක් බව සනාථ කල හැකි සාධක 02 ක් ලියන්න.

II. කැමති ගැමි නාටකයක චරිත දෙකක් හඳුන්වන්න

III. කෝලම් ගැමි නාටකය තුළින් සමාජ සාරධර්ම වර්ධනය වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලාංකිය නර්තන කලාව සංවර්ධනය කිරීම කෙරෙහි රූපවාහිනී මාධ්‍යයෙන් සිදු වන සේවය අගයමින් පුවත් පතකට ලිපියක් සකස් කරන්න.